**කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහයවීමේ ව්‍යාපෘතිය - 2019**

-----------------------------------------------------------------------------

කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහයවීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (ඒඅයිඅයිබී) අතර 2019 අප්‍රේල් 25 දින එළඹී අංක එල්0081 ඒ දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, නාගරික සංවර්ධන, ජලසම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අඩු ආදායම් ලබන ප්‍රජාවගේ නිවාස තත්ත්වය වැඩිදියුණු කිරීම සහ දැරිය හැකි නිවාස ඉදිකිරීම හා ඉඩම් නැවත සංවර්ධනය කිරීම සඳහා වන ආයෝජන තුලින් කොළඹ ඉඩම් පරිහරණ කාර්යක්ෂමතාව ඉහල නැංවීමත් ඒ හා සම්බන්ධ පද්ධති හා ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 50,460 කට සමාන එ.ජ.ඩො. මිලියන 287 ක් වන අතර ඉන් රු.මිලියන 35,163.7 කට සමාන එ.ජ.ඩො මිලියන 200 ක් මූල්‍යයනය කිරීමට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව එකඟ වී තිබූ අතර රු. මිලියන 14,417.2 කට සමාන එ.ජ.ඩො මිලියන 82 ක් ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කිරීමටද රු.මිලියන 879.1 කට සමාන එ.ජ.ඩො මිලියන 5 පෞද්ගලික අංශය විසින්ද මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුලි 22 දින ආරම්භ කරන ලද අතර 2025 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

------

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් , ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරිමේදි එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනිමේදි හා තක්සේරු කිරීමේදි අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 වර්ෂයේදී අයවැය ප්‍රතිපාදන මඟින් විදේශිය ණය සහ ශ්‍රී ලංකා | ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතුවල | 2019 අප්‍රේල් 25 වන දින රජය සහ එඅයිඅයිබි | ක්‍රියාකාරී සැලැස්ම සැලකිල්ලට ගෙන |

| | | | |
|---|---|---|---|
| රජයේ වියදම් සඳහා පිළිවෙලින් රු.මිලියන 1,285 සහ රු. මිලියන 310 ක් ලබාදී තිබුණි. කෙසේවුවද , වෙන්කල ප්‍රතිපාදනයෙන් 2019 වර්ෂය අවසානයේදී විදේශ ණය රු.මිලියන 87.91 ක් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් රු.මිලියන 51.32 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් පිළිවෙලින් සියයට 93.15 ක් නියෝජනය කරන ණය ප්‍රතිපාදන රු. මිලියන 1,197.09 ක් සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන රු.මිලියන 93.15 ක් සමාලෝචිත වර්ෂය තුල උපයෝජනය කර නොතිබුණි. | ප්‍රමාදයන් විය හැකිය. | ආයතනය ණය ගිවිසුම අත්සන් කර තිබුනද, ණය ගිවිසුම බලපැවැත්වෙන දිනය 2019 ජුලි 25 වන දින වේ. එම නිසා එම කාලය තුල ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවාගැනීමට ව්‍යාපෘතිය පියවර ගෙන තිබේ. | ඉලක්කගත ලගාකරගැනීම් තීරණය කල යුතු අතර ඒ අනුව ප්‍රතිපාදන ඉල්ලීම් සිදුකල යුතුය. |

**3. මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටලු**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කටයුතු සඳහා කාර්යමණ්ඩලයට 91 දෙනෙකු බඳවාගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් 2019 ජනවාරි 31 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, 2020 ජුලි අවසන් වන විටත් කාර්යමණ්ඩලය 19 දෙනෙකු පමණක් ව්‍යාපෘති කාර්යමණ්ඩලයට බඳවාගෙන තිබුණි. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රමාද වීමට එය බලපානු ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති කළමනාකරණ අංශය සඳහා කාර්යමණ්ඩල අනුමැතිය ලබාදී තිබුනද, ජනාධිපතිවරණය , පාර්ලිමේන්තු මැතිවරණය සහ කොවිඩ් - 19 හේතුවෙන් බඳවාගැනීම් ප්‍රමාද විය. මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් අනුව සහ භාණ්ඩාගාර ලේකම් විසින් ප්‍රකාශයට පත්කරන ලද නව චක්‍රලේඛ වලට අනුව කාර්යමණ්ඩල බඳවා ගැනීම් බලපෑමට ලක්විය. භාණ්ඩාගාර ලේකම් විසින් වැඩිදුර උපදෙස් ලබාදෙන තෙක් අදාල ආයතනයෙන් පිටත කිසියම් ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්ය මණ්ඩලයක් බඳවාගැනීමෙන් වැලකි | ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම සඳහා සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සිටින ලෙස වැඩිදුර උපදෙස් ලබාදෙන ලදී. | |
| (ආ) | වැදගත් හා රහස්‍ය කටයුතු සඳහා පුරප්පාඩු කිහිපයක් බඳවාගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එම තනතුරුවල පුරප්පාඩු පැවතීම හේතුවෙන් සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන එවැනි කටයුතු රු.1,853,300 ක පිරිවැයකට බාහිර ආයතන සහ පුද්ගලයන් විසින් සිදුකර තිබුණි. | සමහර වැදගත් සහ රහස්‍යභාවයකින් යුක්ත ව්‍යාපෘති තොරතුරු ආරක්ෂා කල නොහැකි වීම. | ව්‍යාපෘති ලේඛනවල කාර්යන්හි රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වගකිව යුතු නිලධාරියකුගේ අධීක්ෂණය සහ සම්බන්ධීකරණය යටතේ බාහිර පුද්ගලයන්ගෙන් මෙම සේවාවන් ලබාගන්නා ලදී. | අවශ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රමාදයකින් තොරව බඳවාගැනීමට පියවර ගත යුතුය. |